**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2021**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**-------**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) | අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත ලබා ගත් අත්තිකාරම් පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ දී අවස්ථා 93 කදී නිකුත් කල එකතුව රු.2,487,448 ක් වූ අත්තිකාරම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබූ අතර එහි ප්‍රමාද කාලය මාස 1 සිට මාස 10 අතර විය. | 2021.12.31 දිනට නොපියවූ අත්තිකාරම් ලෙස දක්වා ඇති 2019 වර්ෂයට අදාල රු. 54,500 ක මුදල සහ 2020 වර්ෂයට අදාලව රු. 98,300 ක මුදල 2022.05.26 දිනය වන විට සම්පූර්ණයෙන් පියවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 826,262 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,968,095 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු රු.2,141,833 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රදාන වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ 1929 දුරකතන අංකයට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම සහ අදාළ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට නිර්දේශ ලබාගැනීම වෙනුවෙන් උපදේශිකාවක් වෙත රු. 900,000 ක් ගෙවා 2017 වර්ෂයේ ලබාගත් වාර්තාව සඳහා වර්ෂ 4 ක කාලයක් ගත වී තිබුණ ද, එහි ඇතුළත් නිර්දේශ හා ක්‍රමවේද අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමු වී නොතිබූ අතර පරිගණක පද්ධතියක් සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රු. 1,200,000 ක් ගෙවා තිබුණද දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | මෘදුකාංගය සමඟ මෙම 1929 දත්ත පද්ධතිය නොගැලපෙන බව | නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් දත්ත පද්ධතියේ පවතින අඩුපාඩු කඩිනමින් නිවැරදි කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ ගතයුතු සියළු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සම්පාදනයට 2010 වර්ෂයේ දී පිහිටුවන ලද ජාතික ළමා ආරක්ෂක අරමුදල 2018 වර්ෂයේ සිට අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එහි රු. 2,843,882 ක ශේෂයක් පැවතුණි. | මෙම අරමුදලෙහි ශේෂය පරීක්ෂා කර බලා නියමිත පරිදි වියදම් කළයුතු බැවින් පරීක්ෂා කිරීම් සිදුකර ප්‍රතිපාදන නිකුත් කිරීමට නියමිත බව | පනතේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අරමුදල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වර්ෂ 1 සිට වර්ෂ 11 කට වැඩි කාලයක සිට පැවතෙන එකතුව රු. 1,868,850 ක් වූ අරමුදල් 3 ක් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | ඉතිරි වී ඇති අරමුදල අරමුණු ගත කාර්යය සඳහා යෙදවීම සම්බන්ධව අවධානය යොමු වී ඇති අතර ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | පනතේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අරමුදල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේදී වර්ෂ 30ක කල් බදු කාලයක් සඳහා රු. 18,317,757 ක වටිනාකමකට ලබාගෙන තිබූ ඉඩමක් වාර්තාවේ දිනය දක්වාම කිසිදු කාර්යයකට නොයොදා නිශ්කාර්ය්‍යාව පැවතුණි. | භාණ්ඩාගාර ප්‍රතිපාදන සැලසුම් කර ඉල්ලීම් කල ද, මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. | සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කල යුතුය. |

**3.4 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ සහාකාර කළමනාකරු (වැඩසටහන්) තනතුර දැරූ නිලධාරිනිය වසර 11කට වැඩි කාලයක සිට වැටුප් හා දීමනා ප්‍රතිපූරණය කිරීමේ පදනම මත බාහිර ආයතනවලට මුදා හැර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම තනතුර සඳහා වෙනත් නිලධාරියෙකුගේ සේවය ලබාගෙන නොතිබුණි. | මේ පිළිබඳව අදාළ නිධාරිනියගෙන් විමසන ලද බවත් ඊට පිළිතුරු වශයෙන් අදාළ නිලධාරිනිය සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ නිල කාලය අවසන් වූ වහාම මෙම අධිකාරියේ නිත්‍ය තනතුරේ රජකාරියට වාර්ථා කරන බව දන්වා ඇත. | මානව සම්පත් කලමනාකරණය විධිමත් පරිදි සිදු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 4 ½ ක පමණ කාලයක් පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය හා තොරතුරු) තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ ඇතුලත් මූලික සුදුසුකම හා සේවා පලපුරුද්ද නොමැති නිලධාරියකු 2021 මාර්තු මාසයේදී බඳවා ගෙන තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තිරණය 201/26 අනුව මෙම අයදුම්කරු බඳවා ගැනිම සිදුකර ඇත. | බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2019 හා 2020 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා 2022 මැයි 19 විගණිත දින වන විටත් සභාගත කර නොතිබුණි. | 2019 භාෂා පරිවර්තනය කර ඇති බව, 2020 අවසන් කෙටුම්පත අවසන් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය පිහිටුවා වසර 20 ක් ගත වූ පසුව 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී ඇති ජාතික ළමා ආරක්ෂක ජාතික ප්‍රතිපත්තිය 2022 මැයි 05 විගණිත දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීමේ කාර්යයන්, ළමා අපචාර වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම ඇතුළු ඊට අනුශාංගික කාර්යයන් ද ඉටු වී නොතිබුණි. | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි නීතිය බලාත්මක කිරීමේ අංශය මඟින් පොලිස් අංශය, විමර්ශන අංශය, මනෝසමාජීය අංශය සහ නීති අංශය වෙත යොමු කරනු ලබන අතර 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අධිකාරිය වෙත වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 100,592 කින් නොවිසඳී ඉදිරියට ගෙනවිත් තිබූ පැමිණිලි සංඛ්‍යාව 47,136 ක් එනම් මුළු පැමිණිලිවලින් සියයට 46 ක් විය. 2020 හා 2021 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම් තුළ අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයක් වන පැමිණිලි විසඳීමේ | පැමිණිල්ලක අවසන් ක්‍රියාමාර්ග ගැනීම යන්න පැමිණිල්ලේ ස්වරූපය අනුව වෙනස් වන අතර එවැනි අවස්ථා මත අවසන් නොවීම හේතුවෙන් පැමිණිලි සඳහා අදාළ ක්‍රියාමාර්ග නොගත් බව අදහස් නොවේ. | 2011 වර්ෂයේ සිට පවතින නොවිසඳී ඇති පැමිණිලි කඩිනමින් විසඳීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| කාර්යභාරය ඇතුලත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල දිස්ත්‍රික්ක 25 තුලින්ම වර්ග 28 කට වෙන්කල හැකි අපවාර හා හිංසන 11187 ක් ලැබී තිබු අතර එම අපවාර සඳහා නොපමාව ක්‍රියාමාර්ග ගත යුතු වුවද එම අපවාර 7492 ක් සම්බන්ධයෙන් විගණිත දින වන විටත් අවසන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඇ) අධිකාරිය පිහිටුවා වසර 22 ක් ගත වී ඇතත් පනත ප්‍රකාරව ජාතික දත්ත පදනමක් සකස් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය දත්ත පද්ධතිය මේ වනවිට සකසා අවසන් කර ඇත. භාවිතයට ගැනීම සඳහා සිදු කිරීමට යෝජනා වූ වෙනස්කම් මේ වනවිට ටෙලිකොම් ආයතනය සිදු කරමින් පවතියි. | ජාතික දත්ත පද්ධතිය කඩිනමින් සකස් කල යුතුය. |

**4.3** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009/(1) හි 3 ඡේදයට අනුව අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර නොතිබුණි. | අධිකාරියේ පවතින පුරප්පාඩු හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරියෙකු අනුයුක්ත කිරීම අපහසු වී ඇත. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කල යුතුය. |